පොලිස්පති චක්‍රලේඛ : /2023
අපරාධ චක්‍රලේඛ : /2023

මගේ අංකය :
පොලිස් මූලස්ථානය
කොළඹ 01 -
2023.03.

සියලූ ම : ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන්
: නියෝජ්‍ය පොලිස්පතිවරුන්
: අණදෙන නිලධාරින් / අධ්‍යක්ෂවරුන්
: ප්‍රාදේශීය කොට්ඨාස භාර නිලධාරීන්
: දිස්ත්‍රික් භාර ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිවේදිත නිලධරයන්
: මූ.පො.ප. / ස්ථානාධිපතිවරුන්

**පොලිස් අත්අඩංගුවේ සිටින සැකකරුවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා පොලිස් නිලධාරීන් විසින් අවධානය යොමු කළ යුතු නෛතික ප්‍රතිපාදන**

## 1. **පූර්විකාව**

1.1. මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශය ඇතුළු අනෙකුත් මානව හිමිකම් පිළිබඳව ජාත්‍යන්තර සම්මුතීන් මගින් මෙන්ම 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් ද, ගරු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දුන් සුවිශේෂී නඩු තීන්දු මගින් ද පුද්ගලයන්ගේ ජීවත්වීමේ අයිතිය සහ කෲර වධහිංසනයන්ගෙන් මිදීමේ අයිතිය පිළිගෙන ඇත.

1.2. නීතියේ සඳහන් කර ඇති නිසි ක්‍රියාදාමය (DUE PROCESS) අනුගමනය කිරීමෙන් පසුව, නිසි අධිකරණයක් මඟින් ලබාදුන් නඩු තීන්දුවක් මගින් මිස ශාරීරිකව හෝ මානසිකව දඬුවම් කිරීම, කෲර වධහිංසාවට ලක් කිරීම නොකළ යුතු අතර, ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ශ්‍රී ලංකා පොලිසිය ද මෙවැනි තත්ත්වයන් උපරිම හැකියාව යොදවා වළක්වා ගැනීමට කටයුතු කිරීමට බැඳී සිටියි.

1.3. පොලිස් අත්අඩංගුවේ සිටින සැකකරුවන්ට අවශ්‍ය ආරක්ෂාව සැපයීමට අපොහොසත්වීම ශ්‍රී ලංකා පොලිසියේ වෘත්තීමයභාවය පිළිබඳව දැඩි ගැටලු සහගත තත්ත්වයක් නිර්මානය කරයි.

1.4. මෙවැනි සිදුවීම් වලින් නීති ගරුක සමාජය කැළඹීමට ලක්වන අතරම ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පොලිසිය අප්‍රසාදයට පත් වීමද සිදුවනු ඇත.

1.5. මූලික අයිතිවාසිකම් වලට ගරු කිරීමේ, ආරක්ෂා කිරීමේ හා ප්‍රවර්ධනය කිරීමේ වගකීම සෑම රාජ්‍ය ආයතනයකටම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින්ම ලබා දී ඇත. සැකකරුවන් අත්අඩංගුවට ගැනීම හා රඳවා තබා ගැනීම වැනි කටයුතු සඳහා ශ්‍රී ලංකා පොලිසිය මැදිහත් වන බැවින් අනෙකුත් රජයේ ආයතන වලට වඩා මෙම තත්ත්වය ශ්‍රී ලංකා පොලිසිය කෙරෙහි බලපානු ඇත.

1.6. එබැවින් අත්අඩංගුවට ගැනීමේදී හා රඳවා තබා ගැනීමේදී නීතියේ සඳහන් නිසි ප්‍රතිපාදන අනුගමනය කිරීම මෙන්ම ඒ සම්බන්ධයෙන් ජාත්‍යන්තර ප්‍රමිතීන් කෙරෙහි ද අවධානය යොමු කිරීම අත්‍යාවශ්‍ය වේ.

1.7. සමාජය තුළ නීතිය හා සාමය සුරක්ෂිත කිරීම මෙන්ම නීතියේ ආධිපත්‍යය (RULE OF LAW) ආරක්ෂා කිරීම ද පොලිස් නිලධාරීන්ගේ වගකීම වේ. සෑම තැනැත්තකුම නීතියට යටත් වන අතර, නීතියේ රැකවරණය ද (EQUAL PROTECTION BEFORE THE LAW) සෑම තැනැත්තෙකුටම හිමි බව තරයේ සිහිතබා ගත යුතුය.

1.8. නිර්දෝෂීභාවයේ පූර්ව නිගමනය (PRESUMPTION OF INNOCENCE) සෑම සැකකරුවෙකු කෙරෙහිම ක්‍රියාත්මක වන බව අවධාරණය කරන අතර, නීතියේ නිසි ක්‍රියාදාමයන් අනුගමනය කරමින් සැකකරුවකු වරදකරු කිරීමට අවශ්‍ය පරිදි සාර්ථක විමර්ශනයක් කිරීම පොලිසියේ කාර්යභාරය වේ.

1.9. සීමිත අවස්ථා කිහිපයකදී හැර, සැකකරුවන්ගේ පාපොච්චාරණ නීතිය ඉදිරියේ වටිනාකමක් නොමැති බව සිහි තබා ගත යුතු අතර, විමර්ශනයන් හිදී පරිවේශනීය සාක්ෂි සහ විශේෂඥ සාක්ෂි කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම අවශ්‍ය බව අවධාරනය කරමි.

## 2. ශ්‍රේෂ්ඨාධිකරණ මූලික අයිතිවාසිකම් අයදුම්පත් අංක 398/2008 ට අදාළ ගරු අධිකරණ නියෝගය

2.1. කොම්පඤ්ඤවීදිය පොලිස් ස්ථානය මගින් කොල්ලකෑම්, මනුෂ්‍ය ඝාතන හා කප්පම් ගැනීමේ සිද්ධීන් සම්බන්ධයෙන් සැකපිට අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවකු වැඩිදුර විමර්ශන සඳහා පොලිස් ස්ථානයෙන් පිටතට රැගෙන ගිය අවස්ථාවේ පොලිස් නිලධාරින් විසින් සිදු කල වෙඩි තැබීමක ප්‍රතිඵලයක් ලෙස සැකකරු මිය යාමේ සිදුවීමක් සම්බන්ධයෙන් සැකකරුගේ බිරිඳ විසින් ශීර්ෂගත මූලික අයිතිවාසිකම් පෙත්සම ගොනු කර ඇත.

2.2. ඉහත මූලික අයිතිවාසිකම් අයදුම්පතට අදාළව ගරු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නියෝගයක් නිකුත් කර ඇති අතර, දිගින් දිගටම පොලිස් අත්අඩංගුවේ දී සැකකරුවන් මිය යාම සම්බන්ධයෙන් සිදුවීම් වාර්තා විම වැඩිවී ඇති බැවින්, එය ඉතා කණගාටුදායක තත්ත්වයක් වන බවත්, මෙවැනි සිදුවීම් වලින් පොලිසිය කෙරෙහි ඇති මහජන විශ්වාසය පලදු වන අතරම, එවැනි සිදුවීම් ශ්‍රී ලංකා පොලිසියේ වෘත්තීමයභාවය සම්බන්ධයෙන් ප්‍රශ්න සහගත තත්ත්වයක් බවත් එම නියෝගය මගින් පෙන්වා දී ඇත.

2.3. මෙම නඩු තීන්දුවෙන් විශේෂයෙන් පහත කරුණු ගරු අධිකරණයේ අවධානයට ලක් කර ඇත.

i. මෙම සිදුවීමට අදාළ සැකකරු, සංවිධානාත්මක අපරාධකරුවෙකු යැයි පොලිස් නිලධාරින් හඳුනා ගෙන ඇති බව.

ii. අත්දැකීම් සහිත පොලිස් නිලධාරින් වශයෙන් මෙවැනි සැකකරුවකු රැගෙන යාමේදී එයට අදාළව ගත යුතු ප්‍රමාණවත් ආරක්ෂක විධිවිධාන ගත යුතු බව.

iii. පිටවීමේ සටහනේ සඳහන් පරිදි, භයානක සැකකරුවන් අත්අඩංගුවට ගැනීමට පිටව යන බව හා පොලිස් නිළධාරින්ගේ ගිනි අවි සහ ඔවුන්ගේ ආරක්‍ෂාව සම්බන්ධව පරීක්ෂාකාරීව සිටින ලෙස උපදෙස් ලබා දී ඇති බව.

iv. ජීප් රථයේ කුඩා ඉඩ ප්‍රමාණය තුල පොලිස් නිළධාරින් 08 දෙනෙකු ගමන් කර ඇති බව හා ඒ අතුරින් නිළධාරින් 06 දෙනෙකු ගිනි අවි සහිතව සිටිය දී මෙම සැකකරු ගිනි අවියක් උදුරා ගැනිමට උත්සාහ කර ඇති බැවින්, පොලිස් නිළධාරින් විසින් පුද්ගලික ආරක්ෂාවේ අයිතිය ක්‍රියාත්මක කරමින් වෙඩි තැබිම සිදුකර ඇති බව සඳහන් කිරීම පිළිගත නොහැකි බව.

v. තවද, මෙම නියෝගය මගින් රජය විසින් රු. 250,000/- ක වන්දි මුදලක් සහ වගඋත්තරකාර පොලිස් නිලධාරීන් විසින් තම පුද්ගලික මුදලින් වන්දි ගෙවිමට ද නියම කර ඇත.

vi. තවද මෙම නඩු තීන්දුව මගින් මෙවැනි සිදුවිම් නැවත සිදුවීම වළක්වා ගැනීම සඳහා පොලිස් නිලධරයන් අනුගමනය කල යුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් උපදෙස් පත්‍රිකාවක් නිකුත් කරන ලෙස පොලිස්පති වෙත නියෝගයක් ද නිකුත් කර ඇත.

**3. පොලිස් අත්අඩංගුවේදී සැකකරුවන් මිය යාම සම්බන්ධයෙන් නිකුත් කර ඇති පොලිස් නියෝග සම්බන්ධව.**

3.1. පොලිස් නියෝග ඒ 20 - පොලිසියේ ආරක්ෂාව භාරයේ සිටින තැනැත්තන් පිළිබඳව නීතිරීති.

3.2. පොලිස් නියෝග ඒ 20 7(බී) - පැනයන්නන් හෝ සැහැසි වන්නට ඉඩ ඇති තැනැත්තන් කැටුව යාමට සෑහෙන තරම් බලවත් ආරක්ෂකයන් යොදන්නට සැළකිලිමත් විය යුතුය.

3.3. පොලිස් නියෝග ඒ 20 7(සී) - කරදරකාරි හෝ සැහැසි තැනැත්තකු වෙනත් කෙනෙකු සමග එක් කොට අත් මාංචු නොදැමිය යුතුය.

3.4. පොලිස් නියෝග ඒ 20 7(ඊ) - සිර භාරයේ සිටින තැනැත්තන් භාරව, ඔවුන් කැටුව යන ආරක්ෂකයන්, ළඟම සිට මෙල්ල කර ගත හැකි තරමට වඩා ඈතට යන්නට හෝ පසුවී එන්නට හෝ කවර ආකාරයකින් වත් නොපෙනී ඉන්නට හෝ කිසි විටකත් ඔවුන්ට ඉඩ නොදිය යුතුය.

3.5. පොලිස් නියෝග ඒ 20 7(එච්) - දුම්රිය මැදිරියකින් හෝ වෙනත් වාහනයකින් බසින විට, ආරක්ෂකයා පළමුව බසින තුරු වෙනත් අය කිහිප දෙනෙකු ඒ ආරක්ෂාව පිට ගෙන යනු ලබන තැනැත්තා පිටුපසින් සිටින ලෙස පොලිස් නිලධාරින් කටයුතු පිළියෙල කල යුතුය.

3.6. <u>පොලිස් නියෝග ඒ 20 7(අයි)</u> - බලවත්ම හේතුවක් ඇත්නම් මිස පොලිස් භාරයේ සිටින තැනැත්තකු වැඩිදුර පරීක්ෂණ සඳහා පොලිස් ස්ථානයෙන් පිටත නොයැවිය යුතුය. එසේ යවන විට ද, ඔහුගේ භාරය සුරක්ෂිත වන පරිදි ප්‍රමාණවත් ආරක්ෂාවන් ඇතිවම යැවිය යුතුය.

3.7. <u>පොලිස් නියෝග ඒ 20 7(ජේ) -</u> ස්ත්‍රියක ආරක්ෂාව යටතේ ගෙන යන විට නෑයෙකු හෝ විශ්වාස කටයුතු පාලිකාවක් හෝ එම තැනැත්තිය කැටුව යා යුතුය.

**4. පොලිස් අත්අඩංගුවේ දී සැකකරුවන් මිය යාම සම්බන්ධයෙන් මීට පෙර නිකුත් කර ඇති පොලිස්පති චක්‍රලේඛ සම්බන්ධව.**

4.1. <u>පොලිස්පති චක්‍රලේඛ අංක 1733/2003</u> - අත්අඩංගුවේ පසු වන සැකකරුවන්ගේ ආරක්ෂා තහවුරු කිරීම පිණිස පහත කරුණු අවධාරණය කර ඇත.

i. පොලිස් නියෝග ඒ 20 ට අනුව කටයුතු කල යුතුය.

ii. අත්අඩංගුවේ පසුවන සැකකරුවන් හට ඔවුන්ගේ කිට්ටුම ඥාතින් හමුවීමට අවස්ථාව සලසා දිය යුතුය.

iii. නීතිඥවරයකු හමුවීමට අවශ්‍ය නම් ඒ සඳහා අදාළ පරීක්ෂණයේ දී ඉදිරි කටයුතු වලට බාධා නොවන අයුරින් සැකකරුවන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් සොයා බැලීමට ඉඩ දිය යුතුය.

iv. මානව හිමිකම් කොමිෂන් සභාවේ නිලධරයන්ට සැකකරුවන් මුණගැසීමේ අවස්ථාව සලසා දිය යුතුය.

v. අත්අඩංගුවේ පසුවන සැකකරුවන්ගේ අයිතිවාසිකම් විස්තර කෙරෙන දැන්වීමක් ඔවුන්ට පෙනෙන සේ සිරමැදියේ හෝ ඒ අසල ප්‍රදර්ශනය කල යුතුය.

4.2. <u>පොලිස්පති චක්‍රලේඛ අංක 2328/2011</u> - පොලිස් අත්අඩංගුවේ සිටින සැකකරුවන්ගේ ආරක්ෂාව සම්බන්ධව ක්‍රියා කළ යුතු ආකාරය.

i. පොලිස් නියෝග ඒ 20 ට අනුව කටයුතු කල යුතුය.

ii. සැකකරුවකු අත්අඩංගුවට ගැනිමේ දී 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 23 වගන්තිය ප්‍රකාරව ක්‍රියා කල යුතුය.

iii. අත්විලංගු දැමීම සම්බන්ධයෙන් තීරණය කිරීම ජ්‍යෙෂ්ඨ නිලධාරියාගේ අභිමතය වන අතර, සැකකරු පැනයාමට වැළැක්වීමට අවශ්‍ය ආරක්ෂක විධිවිධාන ගැනිමට ක්‍රියා කල යුතුය.

iv. තවද, පොලිස් භාරයේ සිටින සැකකරුවෙකු වැඩිදුර විමර්ශන සඳහා පොලිස් ස්ථානයෙන් පිටතට රැගෙන යාමේදී අනුගමනය කළ යුතු පියවර පිළිබඳව ද මෙම චක්‍රලේඛය මගින් ප්‍රතිපාදන දක්වා ඇත.

4.3. <u>පොලිස්පති චක්‍රලේඛ 2539/2015</u> - පොලිස් අත්අඩංගුවේ සිටිය දී සැකකරුවන් මියයාම සම්බන්ධව පහත දක්වා ඇති උපදෙස් ලබා දී ඇත.

i. වැඩිදුර විමර්ශන සඳහා අත්අඩංගුවේ සිටින සැකකරුවන් රැගෙන යන අවස්ථාවේ දී එසේ රැගෙන යන නිලධාරින් විසින් සැකකරුවන්ගේ ආරක්ෂාව සඳහා නිසි ක්‍රියාමාර්ග ගැනිමට කටයුතු කල යුතු අතර, ස්ථානාධිපතිවරුන් හා අධීක්ෂණ නිලධාරින් ඒවා අධීක්ෂණයට ලක්කල යුතුය.

ii. භයානක අපරාධ වලට සම්බන්ධ සැකකරුවන් වැඩිදුර පරීක්ෂණ සඳහා රැගෙන යන සෑම අවස්ථාවක දීම අවමානයට ලක් නොවන අකාරයට ඔවුන්ට අත් විලංගු යොදා ඔවුන් රැගෙන යා යුතු අතර, අත්අඩංගුවෙන් පැන යාමේ අවස්ථාව අවම වන ආකාරයට ආරක්ෂක ක්‍රියා මාර්ග ගැනිමට කටයුතු කල යුතුය.

**5. අත්අඩංගුවේ සිටින සැකකරුවන්ගේ ආරක්ෂාව සඳහා මෙයට පෙර නිකුත් කර ඇති උපදෙස් වලට අමතරව පහත උපදෙස් අනුගමනය කිරීමට ක්‍රියා කළ යුතුය**

5.1. පොලිස් අත්අඩංගුවේ සිටින සැකකරුවෙකු විවිධ හේතු මත මරණයට පත්විය හැකි අතර, උදාහරණ ලෙස ස්වභාවික මරණ, සියදිවි නසා ගැනීම, හදිසි අනතුරු සහ මනුෂ්‍ය ඝාතන පෙන්වා දිය හැකිය. එවැනි සිදුවීම් වළක්වා ගැනීමට හැකි උපරිම උත්සාහය ගැනීම පොලිසිය සතු වගකීමකි.

5.2. ස්වභාවික රෝගී තත්වයකදී පවා උපරිම උනන්දුව යොදවා සැකකරුගේ ජීවිතය ආරක්ෂා කර ගැනීමට ක්‍රියා කළ යුතු අතර. සැකකරුවන්ට වෛද්‍ය ප්‍රතිකාර අවශ්‍ය වන අවස්ථාවල දී සැකකරුවන් රෝහල්ගත කිරීමට ක්‍රියාකර ඒ පිළිබඳව ළඟම ඥාතීන් දැනුවත් කිරීම අවශ්‍ය වේ.

5.3. යම් සැකකරුවකු උපසේවක භාරයට ලබා දෙන අවස්ථාවේදී සැකකරු භාර දෙන නිලධාරියා විසින් සැකකරුගේ රෝගී තත්ත්වයන් පිළිබඳ විමසා ඒ පිළිබඳව උපසේවක දැනුවත් කළ යුතුය.

5.4. සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයන්, මත්ද්‍රව්‍ය, මිනීමැරීම්, කොල්ලකෑම් ආදී බරපතල අපරාධ වලට සම්බන්ධ සැකකරුවන්, අවිආයුධ පුහුණුවක් සහිත සැකකරුවන් හා ත්‍රස්තවාදී ක්‍රියාවලට සම්බන්ධ සැකකරුවන් පොලිස් අත්අඩංගුවේ සිටින අවස්ථා වලදී ඔවුන් පිළිබඳව විශේෂ අවධානයක් යොමු කිරීම ස්ථානාධිපතිගේ වගකීම වේ.

5.5. එවන් සැකකරුවකු අත්අඩංගුවේ සිටින විට විශේෂ ආරක්ෂාවක් යෙදවිය යුතු අතර, සෑම පැය භාගයකට වරක්ම එම සැකකරු සම්බන්ධයෙන් පරීක්ෂාකර උපසේවක නිලධාරියා විසින් තොරතුරු සටහන් පොතේ සටහන් යෙදිය යුතුය.

5.6. එවැනි සැකකරුවෙකු වැඩිදුර විමර්ශන සඳහා පිටතට ගෙන යාමට අවශ්‍ය අවස්ථාවලදී ස්ථානාධිපති විසින් දිස්ත්‍රික් භාර සහකාර පොලිස් අධිකාරි දැනුවත් කර අවශ්‍ය උපදෙස් ලබාගත යුතුය.

5.7. අත්‍යාවශ්‍ය කරුණක දී හැර සැකකරුවන් පිටතට රැගෙන නොයා යුතු අතර, කුමන කරුණක් සඳහා සැකකරු පිටතට රැගෙන යන්නේ ද යන්න සම්බන්ධයෙන් නිශ්චිත සටහන් යෙදීමට ක්‍රියා කළ යුතුය.

5.8. සැකකරුවන් පැනයාම වැළැක්වීමට උපරිම ක්‍රියා මාර්ග අනුගමනය කළ යුතු අතරම සැකකරු විසින් නිලධාරීන්ගේ අවි ආයුධ උදුරා ගැනීමට අවස්ථාව නොලැබෙන පරිදි ඒ සඳහා සුදුසු වාහනයක සුදුසු ස්ථානයක සැකකරු ස්ථානගත කිරීම කළ යුතුය.

5.9. ඉහත 5.5 ඡේදයේ දක්වා ඇති සනයේ සැකකරුවෙකු විමර්ශන සඳහා ස්ථානයෙන් පිටතට රැගෙන යන සෑම අවස්ථාවකදීම අත්විලංගු යොදා රැගෙන යා යුතු අතර, අවශ්‍ය අවස්ථාවන් හිදී කණ්ඩායම් භාර නිලධාරියාගේ අභිමතය මත පමණක් අත්විලංගු ඉවත් කළ හැකිය.

5.10. සැකකරුවෙකු විමර්ශන සඳහා පිටතට රැගෙන යන ලද ඇතැම් අවස්ථාවලදී එම සැකකරු විසින් නිලධාරින්ගේ ගිණි අවි උදුරා ගැනීමේ හා/ හෝ නිලධාරීන්ට හා වෙනත් තැනැත්තන්ට අනතුරක් කිරීමේ අවධානමක් උද්ගත වී ඇති බව අතීත අත්දැකීම් වලින් පෙනී යන අතර, එම නිසා එවැනි අවධානමක් කිසිසේත්ම ඇති නොවන ලෙස කටයුතු කිරීම කණ්ඩායම් භාර නිලධාරියාගේ වගකීම වේ.

5.11. ගිනි අවි, අත් බෝම්බ ආදිය සඟවා ඇති ස්ථානවලට සැකකරුව රැගෙන යන අවස්ථාවලදී අත්විලංගු සහිතව සැකකරු එම ස්ථානවලට රැගෙන යා යුතු අතර, සැකකරුගේ මග පෙන්වීම මත පොලිස් නිලධාරීන් විසින් එම සෝදිසිය/ පරීක්ෂාව සැකකරු ඉදිරියේ දී කළ යුතුය.

5.12. හැකි සෑම අවස්ථාවකදීම එවැනි අවස්ථා වීඩියෝ සාක්ෂි ලෙස ලබා ගැනීමට සුදුසු නිලධාරියකු යෙදවීමට කටයුතු කළ යුතුය. එම වීඩියෝ සාක්ෂි සැකකරුවන්ට එරෙහිව අධිකරණ නඩු කටයුතුවලදී සාක්ෂි ලෙස යොදවා ගැනීමට හැකියාවක් පවතින අතරම යම් සිදුවීමක දී විනිවිද භාවය ආරක්ෂා කර ගැනීමට ද වැදගත් වේ.

5.13. කිසිදු අවස්ථාවකදී සැකකරුවෙකු කෲර වධ හිංසාවට ශාරීරිකව හෝ මානසිකව ලක් කිරීම හෝ පාපොච්චාරණයක් ලබා ගැනීම සඳහා පෙළඹවීමක් තර්ජනයක් හෝ පොරොන්දුවක් ලබා ගැනීම නොකළ යුතුය.

5.14. සැකකරුගේ නීතිඥවරයාට හා ළඟම ඥාතීන්ට, අවස්ථානුකූලව සැකකරු වෙත ප්‍රවේශය ලබා දීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුය.

5.15. පොලිස් විමර්ශනයට බාධාවක් නොවන පරිදි සැකකරුගේ අයිතිවාසිකම් වෙනුවෙන් ඉදිරිපත් වන නීතිඥවරුන්ට සැකකරුගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට උපරිම සහයෝගය ලබා දීමට ක්‍රියා කළ යුතුය.

## 6. සැකකරුවකු පොලිස් අත්අඩංගුවේ දී මියගියහොත් ක්‍රියා කළ යුතු ආකාරය

6.1. පොලිස් අත්අඩංගුවේ දී හෝ පොලිස් විමර්ශනය අතරතුර සිදුවන සෑම මරණයක් සම්බන්ධයෙන් අපක්ෂපාතී සහ විනිවිදභාවයකින් යුතුව විමර්ශනය ආරම්භ කළ යුතු අතර, මහේස්ත්‍රාත් පරීක්ෂණයකට ලක් කළ යුතුය.

6.2. පොලිස් භාරයේ සිටින සැකකරුවකු මියයාමේ සිදුවීමක් වාර්තා වූ විට ඒ සම්බන්ධව සිදුකරන විමර්ශන කටයුතු අවස්ථානුකූලව පළාත් භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිගේ හෝ දිසා භාර නියෝජ්‍ය පොලිස්පතිගේ හෝ කොට්ඨාසභාර නිලධාරියාගේ අධීක්ෂණය යටතේ සිදුකල යුතුය.

6.3. එවැනි විමර්ශණයක් සිදුකල යුත්තේ සිද්ධිය සිදුවූ පොලිස් ස්ථානයට පරිබාහිර ස්ථානයක නිලධාරීන් යොදවා විය යුතුය.

6.4. සැකකරුගේ ඥාතීන්ගෙන් මෙන්ම බාහිර තැනැත්තන්ගෙන් හැකිතාක් ස්වාධීන සාක්ෂි සටහන් කිරීමට උපරිම උත්සාහයක් ගැනීම මෙවැනි විමර්ශණයකදී අනිවාර්ය වේ.

6.5. පොලිස් අත්අඩංගුවේ පසුවන සැකකරුවකු මියගිය අවස්ථාවකදි ඒ පිළිබඳ සිදු කරණු ලබන මරණ පරීක්ෂණ හා විමර්ශන වලට වැඩිමනත් වශයෙන් එම මරණය සම්බන්ධව පොලිස් නිලධාරීන්ගේ යම් රාජකාරි පැහැර හැරීමක් හෝ ඉහත උපදෙස් පරිදි ක්‍රියා නොකිරිමක් තිබේදැයි දැනගැනීම සඳහාත් අවශ්‍ය විනය පියවර ගැනීම සඳහාත් පළාත් භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති වරුන් විසින් තම පළාතට අදාලව තම අධික්ෂණය යටතේ පවත්වාගෙන යන පළාත් විශේෂ විමර්ශන ඒකකය මගින් වහාම පරික්ෂණයක් ආරම්භ කල යුතුය.

6.6. සිද්ධියේ සංකීර්ණ භාවය සැලකිල්ලට ගෙන එම පරික්ෂණය පොලිස් මුලස්ථාන විශේෂ විමර්ශන ඒකකය මගින් සිදු කල යුතු බවට පළාත්භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති තිරණය කරන විට ඔහුගේ නිර්දේශය සමග නොපමාව මා වෙත යොමු කිරීමට පියවර ගත යුතුය.

6.7. අපරාධ විමර්ශනයේදී හා නිලධාරීන්ට එරෙහිව කරන විනය පරීක්ෂණයේදී අපක්ෂපාතී බව සහ විනිවිද භාවය ආරක්ෂා කළ යුතු අතර ළඟම ඥාතීන්ට විමර්ශනයේ/පරීක්ෂණයේ ප්‍රගතිය පිළිබඳ අවශ්‍ය තොරතුරු ලබාදීම කොට්ඨාශ භාර නිලධාරීන්ගේ වගකීම වේ. සැකකරුගේ නීතිඥවරයා හෝ ළඟම ඥාතීන් සඳහා විමර්ශනයේ ප්‍රගතිය පරීක්ෂා කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසිය යුතුය.

7. එබැවින්, මින් ඉදිරියට අත්අඩංගුවේ සිටින සැකකරුවන් සම්බන්ධයෙන් සහ අත්අඩංගුවේ සිටින සැකකරුවකු ඉදිරි විමර්ශන සඳහා පොලිස් ස්ථානයෙන් පිටතට රැගෙන යන අවස්ථාවේ දී ඉහත උපදෙස් පරිදි සියළුම නිලධරයන් කටයුතු කල යුතු අතර, අත්අඩංගුවේ සිටින කාලය තුල සැකකරුවන් මියයාම වළක්වා ගැනීමට කටයුතු කල යුතුය. අධීක්ෂණ නිලධරයන් විසින් මෙම උපදෙස් පරිදි ක්‍රියා කරන්නේ ද යන්න සම්බන්ධව නිරන්තරයෙන් අධීක්ෂණය කල යුතුය.

8. අත්අඩංගුවේ පසුවන සැකකරුවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම රජයේ වගකීමක් වන බැවින්, ඉහත උපදෙස් ඔබ වෙත ලබාදෙන අතර, මෙම උපදෙස් වලට පටහැනිව ක්‍රියා කර ඇති බවට වාර්තා වුවහොත් අදාල නිලධරයන්ට එරෙහිව දැඩි විනය පියවර ගන්නා බවද සියළු නිලධාරීන් වෙත මෙයින් දන්වා සිටිමි.

**සී.ඩී. වික්‍රමරත්න**
**පොලිස්පති**